# බුද්ධස්තෝත්‍ර කෘතියක් වශයෙන් පජ්ජමධු කාව්‍යයේ වැදගත්කම පිළිබඳ විමර්ශනයක්

**දිවුලපැලැස්සේ විමලානන්ද හිමි**

## හැඳින්වීම

පාලි කාව්‍ය සාහිත්‍යය වනාහි සංස්කෘත සාහිත්‍යය තරම් වූ ප්‍රෞඪ හා සමෘද්ධිමත් සාහිත්‍යයක් නොවේ. කාලිදාස, අශ්වඝෝෂ, කුමාරදාස වැනි සංස්කෘත සාහිත්‍යය ඉතිහාසයෙහි සුප්‍රකට කාව්‍ය රචකයෝ ද පාලි සාහිත්‍යය තුළ දක්නට නොමැත. පාලි සාහිත්‍යයේ ඉතිහාසයේ දී භරතසිංහ උපාධ්‍යායන් පවසන්නේ නිශ්චය ලෙසම කාව්‍යයේ අර්ථය නම් මානව ජීවිතයේ ව්‍යාපක, ගහණ හා මාර්මික අනුභවයෙන් ශබ්දයේ හා අර්ථයේ නිර්ව්‍යාජ සුන්දරතාව සමඟ බොහෝ දෙනාගේ හිත පිණිස, සැප පිණිස ප්‍රකාශ කිරීම[1] කාව්‍යයේ ස්වභාවය වන බවයි.

මෙම විග්‍රහයට අනුව නම් සමස්ත ත්‍රිපිටක බුද්ධවචනය ම සර්වෝත්තම කාව්‍යයක් වෙයි. සම්බුද්ධ දේශනාව විචාර සම්පත්තියෙන් යුත්, අර්ථ ගෞරවයෙන් පරිපූර්ණ, ඥානමය ස්වභාවයෙන් යුක්ත සෞන්දර්යාත්මක



කාව්‍යයකි. බුද්ධ ශ්‍රාවක ශ්‍රාවිකාවන් වෙතින් ප්‍රකෘතියෙන් ම හටගත් භාවාත්මක ගීත වූ ථෙරගාථා හා ථෙරීගාථා තුළ කාව්‍යත්වයේ ආකර්ෂණය ඇතුළත්ව පවතී. බුදුන් දවස වැඩසිටි වඞ්ගීස තෙරුන්වහන්සේ පටිභාන කවියෙක් ම බැව් ථෙරගාථාවලින් ගම්‍ය වේ. මාර්ටින් වික්‍රමසිංහයන් ථෙරී ගාථා විවරණ කරමින් 'ථෙරීගාථා ද දිළිඳුකම ජීවිතය නැමැති ණය හිමියා ඉඳුරන් පිණවීම නිසා ඇති කළකිරීම හේතුවෙන් පීඩාවට පත් කතුන්ගේ හදින් විඳි දුක්පීඩා සිහිකිරීම නිසා නැඟුණු වේදනාව තමන්ගේ හද විරාගයට ගඳකිළියක් කර ගත්තාය. එහෙයින් හදින් නැඟී, කටින් පිටවූයේ ආනන්ද ගීතයක්' බව ප්‍රකාශ කරයි.[2] එහෙත් බුදුන්වහන්සේ විසින් සුදේශිත ශ්‍රී සද්ධර්මය තුළත් ථෙර ථෙරී ගාථා තුළිනුත් හුදෙක් පාලි කාව්‍යය සාහිත්‍යය ම පිළිබිඹු වන්නේ යැයි කීම උචිත නොවේ.

පසුකාලීනව රචිත පාලි කාව්‍ය රචනාවල වස්තු විෂය ත්‍රිපිටකයම වූ අතර එම මූලික කරුණු සංශෝධනය කරමින්, සංවර්ධනය කරමින් ඡන්දස් අලංකාර බද්ධකොට රචනා කිරීම එම කතුවරුන්ගේ අරමුණ විය. එහෙත් ඔවුන් විසින් රචිත පාලි කාව්‍ය ග්‍රන්ථ අල්පය. විශේෂයෙන් බෞද්ධ භික්ෂුවට පොළොන්නරු හා දඹදෙණි කතිකාවත් මඟින් ගරහිත විද්‍යාවන්ගෙන් තොර වූ සාහිත්‍ය කාව්‍ය කෘති රචනය ශාසනික ලේඛනයක් ලෙසම රචනා කිරීමට සම්මත කොට ඇත.[3]

විචිත්‍ර කාව්‍ය ප්‍රබන්ධයන්ගෙන් පාලි කාව්‍ය සාහිත්‍ය ග්‍රහණ නොවුනත් අල්ප වූ කෘති වලිනිදු කාව්‍ය ප්‍රතිභාව විශදකිරීමට

ගත්කතුවරුන් උත්සාහ නොගත්තා නොවේ. භාෂාමය දෘෂ්ටියෙන් පාලි කාව්‍ය සාහිත්‍යය වැඩි නැඹුරු බවක් දක්වා ඇත්තේ සංස්කෘතය දෙසටය. විෂය දෘෂ්ටියෙන් පාලි කාව්‍ය ග්‍රන්ථ ප්‍රධාන කොටස් දෙකකට වර්ග කෙරේ.[4] එනම් **වර්ණනාත්මක කාව්‍ය ග්‍රන්ථ සහ කාව්‍ය ආඛ්‍යාන** වශයෙනි. මෙයින් වර්ණාත්මක කාව්‍ය ග්‍රන්ථ වශයෙන් **තෙලකටාහගාථා, ජිනාලංකාරය, ජිනචරිතය, පජ්ජමධු, අනාගතවංසය, සද්ධම්මොපායන, පඤ්චගතිදීපනී** සහ **ලොකප්පදීපසාර** යන ග්‍රන්ථ ඇතුළත් කළ හැකිය. ප්‍රධාන කාව්‍ය ආඛ්‍යාන ග්‍රන්ථ වශයෙන් **රසවාහිනී, බුද්ධාලංකාර, සහස්සවත්ථුප්පකරණ, රාජාධිරාජවිලාසිනී** යනාදිය නම් කළ හැකි අතර ඒවායෙහි ගද්‍ය පද්‍ය දෙඅංගයෙන්ම මිශ්‍රිත රචනාවක් ඉදිරිපත් කරයි.

පාලි භාෂාවෙන් රචිත කාව්‍ය ග්‍රන්ථවලට මූලාධාර වූයේ ත්‍රිපිටකය ආශ්‍රිත බෞද්ධ විෂය ධාරාවක් හෝ පූජනීය වස්තුවක්ය. පාලි සාහිත්‍ය ඉතිහාසයේ සුවිශේෂී සාහිත්‍යාංගයක් වනුයේ 'වංස' සාහිත්‍යයයි. ලාංකේය ප්‍රෞඪ ඉතිහාසයත්, ශාසනික ඉතිහාසයත් විවරණය කෙරෙන අග්‍රගණ්‍ය වංස ග්‍රන්ථද්වය මහාවංසය හා දීපවංසයයි. මෙම ග්‍රන්ථ දෙක පාලි වංස සාහිත්‍ය පරම්පරාවේ මුඛ්‍යස්ථානයේ තබාගෙන පශ්චාත් වංශ ග්‍රන්ථ රචනා වේ. එසේ රචනා වූ සියලුම වංශ කෘතිවලට තේමාව වූයේ බුදුන්වහන්සේගේ යම් ශාරීරික ධාතුන් වහන්සේ නමක් හෝ උන්වහන්සේ පරිභෝජනය කළ යම් පාරිභෝගික වස්තුවක් හෝ බුදුන් වහන්සේ උදෙසා පූජා කළ යම් උද්දේසික වස්තුවක්ය. එසේ නැතහොත් යම් පූජ්‍ය ස්ථානයක් හෝ ශ්‍රේෂ්ඨ චරිතයක්



ග්‍රන්ථ තේමාව වශයෙන් තෝරාගෙන තිබේ. ඒ අනුව බොධිවංසය, ථූපවංසය, දාඨාවංසය, ඡකෙසධාතුවංසය, ලළාටධාතුවංසය, හත්ථවනගල්ලවිහාරවංසය වැනි වංස ග්‍රන්ථ රාශියක් පාලි සාහිත්‍ය ඉතිහාසයට එක්විය. ගද්‍ය සහ පද්‍ය යන දෙඅංගයෙන්ම සම්මිශ්‍රිතව චම්පු කාව්‍ය ස්වරූපයෙන් මෙම වංස ග්‍රන්ථ රචනා වී ඇත. පාලි වංස ග්‍රන්ථවලට බෞද්ධ ක්ෂේත්‍රයක් විෂය වූවාසේ ම පාලි කාව්‍ය ග්‍රන්ථ රාශියකට වස්තු විෂය වූයේ ද බුදුන්වහන්සේගේ යම් ගුණයක් හෝ උන්වහන්සේගේ ජීවන චරිතයේ වැදගත් සිදුවීමක් හෝ උන්වහන්සේ විසින් සුදේශිත ශ්‍රී සද්ධර්මයේ වැදගත් කරුණක් හෝ වෙනත් බෞද්ධ විෂයක්ම ය.

පාලි කාව්‍ය සාහිත්‍යකරුවෝ බුද්ධචරිතය පාදක කරගනිමින් මූලික වශයෙන් **ජිනචරිතය, ජිනාලංකාරය, උපාසක ජනාලංකාරය** වැනි කාව්‍ය ග්‍රන්ථ රචනා කළහ. එසේ ම යම් ඉතිහාස පුවතක් තේමාව වශයෙන් ගෙන සම්බුද්ධ දේශිත ධර්මයෙහිත්, බුදුරදුන්ගේත් ගුණ වර්ණනා කරමින් **සමන්තකූටවණ්ණනා, තේලකටාහගාථා** වැනි පද්‍ය කාව්‍ය ග්‍රන්ථ රචිතය. බුදුන් වහන්සේගේ ශාරීරික ධාතුන්වහන්සේලා පාදක කරගනිමින් **දාඨාවංසය, ඡකේසධාතුවංසය, ලලාටධාතුවංසය** වැනි වංස ග්‍රන්ථ නිර්මාණය විය. **පජ්ජමධුව** ද නිර්මාණය වනුයේ බුදුන් වහන්සේගේ රූපකාය ම පාදක කොට ගතිමිනි. මෙවායින් මුඛ්‍ය වර්ණනාත්මක කාව්‍ය ග්‍රන්ථයක් වන '**පජ්ජමධු**' කාව්‍ය ග්‍රන්ථය පිළිබඳ විමර්ශනයක් සිදුකිරීම මෙම ලිපියෙහි අරමුණයි.

## පජ්ජමධු කාව්‍යය

පජ්ජමධුව වස්තු විෂය වශයෙන් තෝරා ගත්තේ සර්වඥයන් වහන්සේගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් සුපූජිත රූප කාය අනුස්මරණය කිරීමයි. බුදුරජාණන්වහන්සේගේ ශ්‍රී පාද පද්මයෙහි පිහිටි අටෝරාශියක් වූ මංගල ලක්ෂණයන් ද උන්වහන්සේට ම විශේෂිත දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන් ද අසූවක් අනුව්‍යංඤ්ජනයන් ද වර්ණනා කෙරෙන පජ්ජමධුව ධර්මඥානය ලබා දෙමින් ශ්‍රද්ධාවහ ගුණය ඇති කරන කෘතියක් වශයෙන් ද චමත්කාර ජනක කාව්‍යන්ගෙන් පබැඳි ආශිර්වාදාත්මක මංගල ස්තෝත්‍රයක් වශයෙන් ද බෙහෙවින් ප්‍රයෝජනවත් වෙයි.

## කර්තෘත්වය

ආනන්ද වනරතන මහා ස්වාමිපාදයන්ගේ ශිෂ්‍ය වූ ලාංකේය පණ්ඩිත මුක්තාවලියෙහි මහාර්හ මුතු ඇටය බඳු වූ නොයෙක් ශාස්ත්‍ර, නොයෙක් සමය විශාරද 'ශාසන ප්‍රසාදක දීපංකර ශ්‍රී බුද්ධප්‍රියාචාර්යපාදයෝ' මෙහි කර්තෘ වූහ.[5] 'බුද්ධප්‍රිය' යනු ග්‍රන්ථ කතුවරයෙකු බවත්, ඔහු 'දීපංකර' නාමයෙන් ද හඳුන්වන බවත්, දකුණු ඉන්දියානු චෝළ දේශවාසියෙකුව උපන් බවත් පසුව ලංකාවට පැමිණ වනවාසි ආනන්ද වනරතන හිමියන්ගේ ශිෂ්‍යයෙක්ව 'රූපසිද්ධි' නම්



පාළි ව්‍යාකරණය ද 'පජ්ජමධු' නම් පාලි කාව්‍යය ග්‍රන්ථය ද රචනා කළ බව කියවේ.[6]

පජ්ජමධු කර්තෘ බුද්ධප්පිය දීපංකර වන අතර ආනන්ද වනරතන හිමියන්ගේ ශිෂ්‍යයෙක් වශයෙන් ද ආනන්ද වනරතන හිමියෝ සංඝරක්ඛිත හිමියන්ගේ ද උදුම්බරගිරි මේධංකර හිමියන්ගේ ද ශිෂ්‍යයෙකි. මේ වියතුන් සියලුදෙනා පොළොන්නරු සහ දඹදෙණි කාලවලට අයත් වන අතර මොවුන් අතුරින් බුද්ධප්‍රිය තෙරුන් වයසින් බාලමයා ය.[7]

ශ්‍රී බුද්ධ වර්ෂයෙන් 1703 දී ලංකා රාජ්‍ය පදප්‍රාප්තව නොයෙක් දේශයන් යටත් කොට, සියලු රාජශ්‍රීයෙන් විරාජිතව පොළොන්නරුව අග්‍රරාජධානිය කොට රජ කළ 'ශ්‍රී සඞ්ඝබෝධි පරාක්‍රමබාහු' නම් රජුන් විසින් මාහැඟි කොට කරවනලද දක්ෂිණාරාමයෙහි විහාරාධීශ්වරව පජ්ජමධු කර්තෘ බුද්ධප්පිය හිමියන් වැඩ සිට ඇත. බුද්ධප්‍රියාචාර්ය 'ආනන්ද වනරතන' මහා ස්ථවිරයන් වහන්සේගේ ම ශිෂ්‍යයෙකැයි අවධාරණය කරමින් තමා විසින්ම මාගධී භාෂාවෙහි පද සිද්ධිය අවබෝධය පිණිස කාත්‍යායන සූත්‍රයන් ආශ්‍රය කොට කරණ ලද බව මහා රූපසිද්ධි ප්‍රකරණයෙහි දක්වයි.[8] 'දීපංකර බුද්ධප්‍රිය' නාමයෙන් ද හැඳින්වූ උන්වහන්සේ සොළීරට බාලාදිත්‍යවාසය හා චූඩාමණිවර්මවිහාරය යන විහාරද්වයෙහි වැඩවෙසෙමින් බුදුසසුන බැබළ වූ බැවින් 'චෝළිය බුද්ධප්පිය' යන නාමය ද ව්‍යවහාර කරන ලදි. මෙකී

ආරාමයන්හි වැඩවිසූ මෙතුමා දමිළ දේශයට පහනක් බඳු වූවෙකි.[9]

ආනන්ද වනරතන මහා ස්ථවිරයන් වැනි වූ, හිරු රැසින් නිරතුරු පිපී සිටියා වූ මනාව වැඩුණු වෘක්ෂය ප්‍රියාව ඇසුරු කරන සුළු වූ, එහෙයින්ම නිරතුරු හිරු රැසින් ප්‍රිය වූ ප්‍රබෝධයාගේ සෞභාග්‍ය ගුණයෙහි ප්‍රිය වූ එහෙයිනිදු බුද්ධප්‍රිය නම් වූ, වෘද්ධප්‍රාප්ත භෘඞ්ගයා විසින් බඳනා ලද 'පද්‍යය වැනි වූ මී' සත්‍වයෝ පානය කෙරෙත්වා යනුවෙන් පජ්ජමධුවේ ම කර්තෘ සන්දර්ශනයත්, ආචාර්යත්වයත්, ග්‍රන්ථනාමයත් මැනවින් දක්වා ඇත.[10] එසේම **පජ්ජමධු සන්නයේ** දී බාහුශ්‍රැත්‍යාදි ගුණප්‍රියත්‍වයෙන් සද්ගුරු සංසේවය ද, සද්ගුරු සමවායෙන් සත් සමය විවේකය දැන බුදුන් කෙරෙහි භක්තිය ද, ස්ථවිර ද වන බවත් එසේ ස්ථිර පරිණත වූ බුද්ධි ඇත්තක්හු විසින් විරචිත පද්‍යය ආස්වාදයට නිසි වන බවත් දක්වන ලදි.'[11]

පජ්ජමධුව සහ රූපසිද්ධිය ග්‍රන්ථ දෙකම බුදු දහම සංවර්ධනය වී තිබුණු සොළී රටේ දී නිශ්චිත වශයෙන්ම රචනා කරන ලද බවත් පසුව සාසනවංසදීපයත්, රූපසිද්ධියට ටීකාවත් කළ බවත් සඳහන් වේ.[12] ගුණපාල මලලසේකරයන් සඳහන් කරන්නේ රූපසිද්ධියත්, පජ්ජමධුවත් රචනා කර ඇත්තේ බුදු දහම බොහෝ සෙයින් සමෘධිමත් වූ චෝළ දේශයේ වාසය කරමින් විහාරස්ථාන දෙකක අධිපතිත්වය දරමින් තම හැකියාවන්ට මහත් කීර්තියක් ලබමින් සිටිය දී බව යි.[13]



බුද්ධප්‍රියාචාර්යයෝ ශ්‍රද්ධාශීලාදි අනේක ගුණසමුදායකින් සමන්විත වූ ධර්මාදි ශාස්ත්‍රයන් මනාකොට උගත් බොහෝ වියත් ශිෂ්‍යය පරම්පරාවක් ද ඇතිව බුදුසසුන බැබළ වූ උතුමෙකි. මෙතුමාගේ අවසාන ශිෂ්‍යයා වූ **'සිද්ධාර්ථ'** නම් පඬිවරයා විසින් විරචිත 'සාරසඞ්ග්‍රහ' නම් විචිත්‍ර ධර්මප්‍රකරණාවසානායේ දක්ෂිණාරාමාධිපති, ත්‍රිපිටකයෙහි හසළ දැනුමැති බුද්ධප්‍රිය තෙරුන්ගේ අවසාන ශිෂ්‍යයා තමා බවත් දක්වා ඇත.[14]

මෙතුමා පාණිනී, කාතන්ත්‍ර, චාන්ද්‍ර, ආදී නොයෙක් ශබ්ද ශාස්ත්‍රයන් ද තර්ක, ආගමාදිය ද, තෙවළා බුදුදහම ද මනාකොට ඉගෙනීමෙන් බුද්ධධර්මයෙහි ද නොයෙක් ශාස්ත්‍රයන්හි ද විවිධ සමයාන්තරයන්හි ද විශාරදත්‍වයක් ඇතිව මාහැඟි ප්‍රකරණයක් කළ ශ්‍රේෂ්ඨ ග්‍රන්ථ රචකයෙකි. පසුකාලීනව රචිත ව්‍යාකරණ ග්‍රන්ථවල යම් ව්‍යාකරණ ලක්ෂණයක් විවරණ කිරීමේ දී 'චෝළීය බුද්ධප්‍රියාචාර්යන්' ගැනත් සඳහන් කර තිබීමෙන් එතුමා සතු වියරණ දැනුමෙහි විශාරදත්‍වය සනාථ කරයි.[15] ඇතැම් විට පසුකාලීන වියරණ ඇදුරන් යම් ව්‍යාකරණ නීතියක් විග්‍රහ කිරීමේදී පෙර වියරණ ඇදුරන්ගේ නාමාවලියට අනුව බුද්ධප්‍රියාචාර්යන් පළමුව හඳුන්වා ඇත. එයින් එතුමා සතු වියරණ දැනුමෙහි පෘථුල බව සමස්ත වියත් පරම්පරාවන්හි ම පැතිර ගොස් තිබූ බව ද පැහැදිලි වේ.[16]

බුද්ධප්‍රියාචාරීන් විසින් විරචිත රූපසිද්ධිය වනාහි කච්චායන ව්‍යාකරණය හැදෑරීමට බෙහෙවින් උපකාරීවන

ව්‍යාකරණයකි. රූපසිද්ධියෙහි මෙන් කච්චායනයෙහි සූත්‍ර විග්‍රහයන් සුබෝධ නොවේ. රූපසිද්ධිය කච්චායනයට හාත්පසින් ම සම්පූර්ණ ග්‍රන්ථයකි. සූත්‍ර නොව, උදාහරණ ප්‍රධානත්වයෙහි ලා තබාගෙන රූපසිද්ධිය රචනා කර ඇත. පද රූපයන්ගේ සිද්ධිය මුල්කොට කරන ලද හෙයින් මෙයට **'රූපසිද්ධිය'** යන නාමය ද ලැබෙයි.[17] රූපසිද්ධි සන්න්‍ය ගැටපද, රූපසිද්ධි සන්න්‍ය පිටපත් යනුවෙන් ග්‍රන්ථ දෙකක් ද තිබූ බව පඤ්චිකාප්‍රදීපයෙහි සඳහන් වේ.[18] මෙයින් පෙනෙනුයේ බුද්ධප්‍රිය හිමියන් ප්‍රධාන කච්චායන ව්‍යාකරණ ඇසුරු කළ ඇදුරු පරපුරක් මේ අවධියේ සිටි බවයි.

බුද්ධප්පිය හෙවත් චෝළිය දීපංකර හිමියන් නාම මාත්‍රයෙන්ම දැක්වෙන පරිදි දකුණු ඉන්දියාවේ චෝළ ප්‍රදේශයේ උත්පත්තිය ලැබූවෙකි. මෙතුමා පොළොන්නරු අවධියේ පණ්ඩිත පරාක්‍රමබාහු නිරිඳුන් විසින් චෝළ දේශයෙන් ලංකාවට වැඩම කරවාගෙන අවුත්,[19] මෙහි ශාසනය නැවත ස්ථිර ලෙස පිහිටුවීමට කැමති කරවාගත් සංඝයා වහන්සේලාගෙන් එක් නමක් විය. රූපසිද්ධි, පජ්ජමධු ග්‍රන්ථද්වයෙහි ම කර්තෘ වූ මෙතුමා චෝළ රටෙහි වාසය කරන කාලයේ මෙම ග්‍රන්ථදෙක ම රචිත බව සඳහන් වේ. ගන්ධවංසයෙහි **'සාරත්ථසඞ්ගහ'** නම් තවත් ග්‍රන්ථයක් බුද්ධප්පිය නාමයට පවරයි[20]. එහෙත් සිංහල සාරාර්ථසංග්‍රහයෙහි කර්තෘ වූ සරණඞ්කර හිමියන් තම කෘතිය මුල් පාලි ග්‍රන්ථයක පරිවර්තනයක් නොවන බව සඳහන් කරයි. රූපසිද්ධියට කරන ලද ටීකාවෙහි ද කර්තෘත්වය බුද්ධප්‍රියාචාර්යයන්ට ම අයත් යැයි තවත් මතයකි.[21] රූපසිද්ධි ටීකාව ද රූපසිද්ධි කර්තෘ වූ බුද්ධප්‍රිය



තෙරුන් විසින් ම විරචිත යැයි[22] සඳහන් පාඨයෙන් සනාථ කෙරෙන නමුත් එහි ප්‍රණාම ගාථාවකුදු දැකගත නොහැකිය.

බුද්ධප්‍රිය තෙරුන්ගේ ආචාර්ය වූ උපාසකජනාලංකාර කර්තෘ **'භදන්ත ආනන්ද මහාස්ථවිරතුමන්'** තම කෘතියේ දී මේ අවධියේ රටෙහි සිදු වූ වැදගත් ඉතිහාසයමය ප්‍රවෘත්තියක් ඇතුළත් කරයි. එයින් හෙළිවෙන සුවිශේෂී කරුණ නම්, දමිළ සතුරන් මෙරට පැමිණ වියවුල් ඇති කළ විට ලක්දිව උගත් තෙරවරු සොළී රටට ගොස් **'චොඩගඞ්ග'** රජ කරවූ **'පෙරම්පල්ලි'** විහාරයේ විසූ බවයි.[23] ආනන්ද වනරතන ස්ථවිරයෝ ද චෝළ දේශයට ගොස් ඒ විහාරයේ වැඩවසමින් උපාසකජනාලංකාරය රචනා කළහ. ඇතැම් තෙරවරුන්ගේ නාමයන්ට මුළින් **'සීහළාචරිය'** යනුවෙන් සඳහනක් වනුයේ එසේ ලංකාවෙන් සොළී රටට ගොස් විසූ සිංහල ජාතික භික්ෂූහුය. මෙසේ සොළී රට භික්ෂූන් හා මෙරට භික්ෂූන් දිගුකාලයක පටන් මහත් සබැඳියාවකින් කටයුතු සිදුකොට ඇති බව පැහැදිලිය. එසේ ම චෝළීය ජාතික දීපඞ්කර බුද්ධප්‍රියාචාර්යයන්ගේ සම්බන්ධය ද අප සතු වුයේ එහි ප්‍රතිඵලයක් නිසාවෙනි. සොළී ජාතිකයෙක් වූ බැවින් 'චෝළීය බුද්ධප්‍රිය' වශයෙනුත් සොළී රටෙහි බාලාදිත්‍ය විහාරය හා චූඩාමණිවර්ම විහාරද්වයෙහි වැඩ වෙසෙමින් දෙමළ රටට ප්‍රදීපයක් මෙන්,[24] ශාසනය බැබළ වූ හෙයින් 'දීපඞ්කර බුද්ධප්පිය' නම් අපර නාමයකින් ද මෙම තෙරුන් හැඳින්වේ. මෙතුමා පජ්ජමධුව අවසානයේ දී මනාව සර්වඥ ගුණයෙන් ප්‍රමුදිත වූ බුද්ධප්‍රිය නම් භෘඞ්ගයා

විසින් විරචිත පද්‍යමධුව පානය කරනු ලැබේවා[25] යනුවෙන් ස්වකීය නාමය ඉදිරිපත් කර ඇත.

### කාලනිර්ණය

පජ්ජමධු කර්තෘභූත 'චෝළීය දීපංකර බුද්ධප්‍රියාචාර්යයන්' විසූ කාලය පිළිබඳ නිවැරදි නිගමනයකට එළඹිය හැකි වන්නේ එතුමාගේ ආචාර්ය ආනන්ද වනරතන මහාස්ථවිරයන් පිළිබඳවත් බුද්ධප්‍රියාචාර්යයන්ගේ ශිෂ්‍ය සිද්ධත්ථ තෙරුන් පිළිබඳවත් මනා විග්‍රහයක් කිරීමෙන් අනතුරුව ය. ආචාර්ය භදන්ත ආනන්ද වනරතන මහා ස්ථවිරයෝ සමන්තකූටවණ්ණනාව සහ රසවාහිනිය කළ වේදේහ හිමියන්ගේ ආචාර්යයෝ ය.[26] මෙම ආනන්ද වනරතන මහාස්ථවිරතුමා අභිධර්ම මූලටීකාව කළ ආචාරීන් ය. අභිධර්ම අටුවා සියල්ලට ම 'පරමත්ථප්පකාසිනී' නම් අභිධර්ම මූලටීකාව සම්පාදනය කළ ආනන්ද වනරතන තෙරුන් ධම්මමිත්ත තෙරුන්ගේ ඇරයුමෙන් කළ බව ග්‍රන්ථාවසානයෙහි දැක්වේ.[27]

ආනන්ද තෙරුන් අටුවාචාර්ය ධම්මපාල තෙරුන්ටත් පෙර විසූවෙක් බව අභිධම්මමූල ටීකාවට අනුටීකාවක් රචනා කිරීම තුළින් පැහැදිලි වේ.[28] සාරිපුත්ත සංඝරාජයන්ගේ ශිෂ්‍ය වූ සුමංගල මහාසාමීන් ලියූ ටීකා පොත්වල 'ආනන්දාචාර්යතුමා මෙසේ කියන්නේය' වශයෙන් සඳහන් තැන් කීපයක් දක්නට ඇති බැවින් මෙතුමා පරාක්‍රමබාහු



කාලයට පෙරසිටි බව නිසැකවම කිවහැකිය. ආනන්ද වනරතන හිමි වියත් පඬිරුවන් රැසක් බිහිකළ ආචාර්යවරයෙකි. රූපසිද්ධි ව්‍යාකරණය හා පජ්ජමධුව රචනා කළ සොළී රටවැසි දීපංකර බුද්ධප්‍රිය තෙරණුවන් ද[29] රසවාහිනිය හා සමන්තකූටවණ්ණනාව කළ වේදේහ හිමියන් ද 'සාරත්ථසමුච්චය'[30] නම් සතර බණවර අටුවාව ලියූ තෙරුන් ද මෙතුමාගේ ශිෂ්‍යයෝ වූහ.

ආනන්ද වනරතන හිමියන්ගේ පරමත්ථප්පකාසිනී නම් අභිධර්ම මූලටීකාවට අනුටීකාවක් බදරතිත්ථවාසී ධම්මපාල තෙරුන් ලියූවේ නම් ධම්මපාලාචාර්යයන්ටත් පූර්වයෙන් ආනන්ද වනරතන හිමියන් විසූ බව පැහැදිලිවම පෙනෙන කරුණකි. පජ්ජමධුව කළ චෝළීය දීපංකර බුද්ධප්‍රිය ද ආනන්දාචාර්යයන්ගේ ශිෂ්‍යයෙකු වූ බැවින් ක්‍රි.ව. 976 ට පූර්වයේ දී වාසය කළ යුතුය. මූලටීකා කර්තෘ වූ ආනන්ද වනරතන නාමය මහා පරාක්‍රමබාහු අවධියේ දී සම්පාදිත වූ සුමංගල හිමියන්ගේ 'අභිධම්මත්ථවිකාසිනී' ටීකාවේ ඇතුළත්ව තිබෙන බැවින් එතුමා මහපැරකුම්බා කාලයට පෙර විසූවෙකි. බු.ව. 1797 දී පමණ රාජ්‍යත්වයට පත් ද්වීතීය පණ්ඩිත පරාක්‍රමබාහු රජුගේ කාලයේදීත් 'ආනන්ද' නාමයෙන් ප්‍රකට වූ තෙරනමක් වූ නමුත් එතුමාට 'වනරතන' යන උපපද නාමය නොවුණු බැවින් ඒ වෙනත් අයෙක් ලෙස ද සැලකේ. කෙසේ වෙතත් මූලටීකා කර්තෘ ආනන්ද වනරතන හිමියනුත්, පරමත්ථමඤ්ජුසා නම් විසුද්ධි මග්ගටීකාව කළ ධම්මපාලාචාර්යතුමාට ආසන්න කාලයක විසුවේ යැයි නිගමනයකට එළඹිය හැකිය.

ආනන්ද වනරතන හිමියන් පිළිබඳ සිරිසඟබෝ විජයබාහු රජුගේ පොළොන්නරු රජමාළිගා ලිපියට අනුව විසූ කාලය පිළිබඳ නිරවද්‍ය කාල නිර්ණයකට එළඹිය හැකිය.

**ස්වස්ති ශ්‍රී,**
**ආනන්දනාමවිදිතො පියති(දයි) සත්තො,**
**ලංකාකලුසසිතධජො පවරො යතී(සො)**
**යො තම්බරට්ඨයති - - - ථෙරභූතො,**
**චොළෙසු සාසන - - - - කාසිධීරො**[31]

ක්‍රි.ව. 1017 සිට ක්‍රි.ව. 1070 දක්වා වූ දීර්ඝකාල පරාසයක් සොළීහු උතුරේ **'මුම්මඩි චෝළ මණ්ඩලම්'** නමින් එක් ප්‍රදේශයක පාලන බලය පැතිරීම වෙනුවට තම පාලන කේන්ද්‍රස්ථානය **'ජයනාථ මංගලම්'** වශයෙන් පොළොන්නරුව නම් කොටගෙන රුහුණු සහ මලය රටේ සිංහල කුමාරයන්ගේ බලය මර්දනය සඳහා කටයුතු සිදුකළහ. රටේ අවුල්, වියවුල්වලින් ගහණ වූ සොළී කාලය (11 සියවස) දේශපාලනික, ආර්ථික, සාමාජික ආදී සෑම අංශයක්ම අස්ථාවරත්වයක පැවතුණි.[32] රටේ පැන නැඟෙමින් තිබූ අභ්‍යන්තර අවුල් වියවුල් සංසිඳවීමෙන් ක්‍රි.ව. 1070 දී ලංකාව චෝළ හමුදාවන්ට බලවත් ප්‍රහාරයක් එල්ලකරමින් ඔවුන් පළවාහැර පොළොන්නරුවේ තම බලය පතුරුවා ගැනීමට **'කිත්ති'** කුමරුට හැකියාව ලැබුණි. ඉන් පසු වසර 3 කට පසු එනම් ක්‍රි.ව. 1073 දී **'මහා විජයබාහු'** නමින් දෙමළ මුළු නමැති අඳුරු දුරලා රට එක්සේසත් කරන ලදි.[33] සෙනරත්



පරණවිතාන සූරීන් ලක්දිව එක්සේසත් කළ එතුමා පිළිබඳ ප්‍රශංසාර්හ මුඛයෙන් වර්ණනා කරනුයේ මෙසේය.

**''විජයබාහු ලංකාව පාලනය කළ රජුන්ගෙන් ශ්‍රේෂ්ඨතමයා ය. මොහු සිංහාසනාරූඪ වන කල ලංකාවේ චෝළ ආධිපත්‍ය දැඩිව තහවුරු වී තිබිණි. ....... දකුණු ඉන්දියාවේ පාලනය පිළිබඳ වූ වියවුල ලද අවසරයෙන් ද්‍රවිඩ සොළී බලය සම්පූර්ණයෙන් බිඳහෙලා මුළු ලක්දිව එක්සේසත් කළේය.''**[34]

පොළොන්නරුව වසර 40 ක් පමණ දීර්ඝ කාලයක් රාජ්‍ය පාලනය කළ මහවිජයබාහු රජ සමයේ දී ආනන්ද වනරතන හිමි සමකාලීනයෙක්ව සිටි බවත්, ලක්දිව බැබළුණු පතාකයක් වැනි උතුම් යතිවරයෙක් වූ බවත්, චිරප්‍රසිද්ධ උන්වහන්සේ සොළී රටෙහි ද සම්බුද්ධ ශාසනය බැබළ වූ බවත් ඉහත ලිපියට අනුව පැහැදිලි වේ.

පජ්ජමධු කර්තෘ බුද්ධප්‍රිය තෙරුන්ගේ ආචාර්ය වූ ආනන්ද වනරතන හිමියෝ සංඝරක්ඛිත හා උදුම්බරගිරි මේධංකර හිමිවරුන්ගේ ශිෂ්‍යවරයෙකි. මේ ආචාර්යවරු සියලු දෙනා පොළොන්නරුව සහ දඹදෙණි යුගද්වයට ම අයත් වන බවත් මොවුන් අතුරෙන් බාලමයා වූ බුද්ධප්පිය 13 වන සියවසට අයත් බවත් එමනිසා පජ්ජමධුව ද ඒ කාලයට අයත් බවත් සඳහන් කරයි[35].

බුද්ධප්පිය තෙරුන් විසූ කාලය නිශ්චිත වශයෙන් ම සඳහන් කළ නොහැකි වුවත්[36] වේදේහ ද බුද්ධප්පිය ද ආනන්ද වනරතන තෙරුන්ගේ ශිෂ්‍යයෝ වන බැවින් ක්‍රි.ව. 976 ට පූර්වයෙන් බුද්ධප්පිය තෙරුන් වාසය කළ යුතුය. වනරතන තෙරුන්ගේ මූලටීකාවට අනුටීකාවක් ලියන බදිරතිත්ථවාසී ධම්මපාල තෙරුන් ක්‍රි.ව. 976 වර්ෂයේ විසූ බව සඳහන් වීමෙන් බුද්ධප්පිය තෙරුන් ආනන්ද වනරතන තෙරුන්ගේ ශිෂ්‍යයක් වූ බැවින් ඊට පෙර සිටිය යුතු බව අනුමාන කළ හැකිය. පෙළ අටුවා ටීකා ග්‍රන්ථවලින් දතයුතු කරුණු උපුටා සංග්‍රහ කළ ග්‍රන්ථයක් වන **සාරසංග්‍රහය** රචනා කළ සිද්ධත්ථ නම් තෙරුන් බුද්ධප්පිය නම් තෙරණුවන්ගේ ශිෂ්‍යවරයෙකි. එබැවින් ග්‍රන්ථාවසානයේ දක්වනුයේ දක්ෂිණාරාමාධිති වූ පිටකත්‍රය දරන්නා වූ බුද්ධප්පිය මහතෙරුන්ගේ ශිෂ්‍යයන් අතුරෙහි අන්තිම ශිෂ්‍යයා වූ ප්‍රාඥ වූ, මනා පැවැතුම් ඇති සිද්ධත්ථ නම් තෙරුන් විසින් විචිත්‍ර වූ 'සාරසංග්‍රහ' නම් ග්‍රන්ථය කරන ලද බවයි.[37]

මහා විජයබාහු රජතුමාගෙන් පසු නැවත අස්ථාවරත්වයට පත් ලංකා රාජ්‍යය දේශපාලනික, ආර්ථික, සාමාජීය, ආගමික, අධ්‍යාපනික වශයෙන් සෑම අංශයකින්ම සමෘද්ධිමත් කරමින් පොළොන්නරුවට පමණක් සීමා නොවී මුළු රටේම ස්වර්ණමය යුගයක් ඇති කරනුයේ මහපරාක්‍රමබාහු රජතුමාය.[38] ආගමික දියුණුව සඳහා විශේෂයෙන් උත්සුක වූ මහපැරකුම් නිරිඳු අලජ්ජීන්ගෙන් කෙළෙසෙමින් පැවති සම්බුද්ධ ශාසනය නැවත ශාසන සංශෝධනයක් සඳහා කටයුතු කිරීම සුවිශේෂයි.[39] මේ ශාසන සංශෝධනයේ දී ප්‍රධානත්වය ලබාදෙන ලද්දේ උදුම්බරගිරි



මහා කාශ්‍යප තෙරුන්ටය. උදුම්බරගිරි මහා කාශ්‍යප හිමියන්ට තමා කළ සංඝ සංශෝධනයේ දී ප්‍රධානත්වය දී තිබීමෙන් පෙනෙනුයේ උදුම්බර පාර්ශ්වීය තෙරවරුන් කෙරෙහි වැඩි නැඹුරුවක් රජතුමා දක්වා ඇති බවයි. දිඹුලාගල අරඤ්ඤවාසී මහා කාශ්‍යප තෙරුන්ගේ ශිෂ්‍යවරයෙක් ලෙස පොළොන්නරු යුගයේ පාලි සාහිත්‍ය පෝෂණයෙහි පුරෝගාමී වූ මහපැරකුම් නිරිඳුන් විසින් පූජා කළ ජේතවනාරාමයේ විසූ[40] සාරිපුත්ත සංඝරාජ මාහිමියන්ට ලැබෙනුයේ අද්විතීය ස්ථානයකි. උන්වහන්සේගේ ශිෂ්‍ය පරම්පරාවේ එක් අයෙකු ලෙස උදුම්බරගිරි නිවාසී මේධංකර හිමි සඳහන් වේ. උන්වහන්සේගේ ශිෂ්‍යවරයෙක් ලෙස 'ආනන්ද වනරතන' හිමියන් ගැන ද සඳහන් කරයි. ආනන්ද වනරතන හිමියන් වනාහි බුද්ධප්පිය තෙරුන්ගේ ආචාර්යයෝය. මෙම ආචාර්ය පරම්පරාව අනුව විමසා බැලීමේ දි දීපංකර බුද්ධප්පිය තෙරුන් උදුම්බරගිරි පාර්ශ්වයට අයත් තෙරනමක් බව පැහැදිලිය. එසේම පැරකුම් නිරිඳුන් විශේෂ නම්‍යශිලීත්වයක් හා ගෞරවයක් ද දක්වා ඇත්තේ උදුම්බරගිරි පාර්ශ්වීයයන්ට බව ද සංඝ සංශෝධනාරම්භයේ දීම පැහැදිලි වේ. එමනිසා පොළොන්නරුවේ පැරකුම් නිරිඳු කල දක්ඛිණාරාමය බුදධප්පිය තෙරුන්ට පූජා කරන්නට ඇතැයි යන මතය සනාථ කළ හැකිය. ශ්‍රී සඞ්ඝබෝධි මහාපරාක්‍රමබාහු මහරජුන් විසින් කරවන ලද පුලස්තිපුර දක්ෂිණාරාමයෙහි බුද්ධප්පියාචාර්යන් ආධිපත්‍යය දැරූ බව එතුමාගේ ශිෂ්‍ය ශ්‍රී සිද්ධාර්ථ ස්වාමීන් කළ සාරසඞ්ග්‍රහයෙහි දැක්වෙන හෙයින් ද බුරුම දේශයෙන් මෙහි අවුත් උපසම්පදා ලැබ දස වර්ෂයක් පමණ ධර්ම ශාස්ත්‍රෝද්ග්‍රහණය

කළ කච්චායන සූත්‍ර නිර්දේශයෙහි රූපසිද්ධි නාමය සඳහන් වන හෙයින් ද පජ්ජමධුව මහා පැරකුම්බා රජු දවස හෝ ඉන් මඳ කලකට පසුව හෝ රචනා කරන ලදැයි නිශ්චය කළ හැකිය.[41]

### ග්‍රන්ථ අරමුණ

ත්‍රිවිධ රත්නයෙහි ගුණානුස්මරණය සහ සියලු සත්වයන් කෙරෙහි මෛත්‍රිය දැක්වීම, සියලු ගුණාධිගමයට මුල්වන බැවින් රත්නත්‍රය ගුණානුස්මරණ මුඛයෙන් සත්වහිතාසිංශනය ද සත්වහිතාසිංශන මුඛයෙන් රත්නත්‍රය ගුණානුස්මරණය ද එක් වාක්‍ය ප්‍රයෝගයක් කරනු පිණිස ධම්ම, සංඝ රත්නද්වයට බුද්ධ රත්නය ප්‍රධාන නිසා ඒ බුද්ධ රත්නයාගේ ද රූපකාය, ධර්මකාය දෙකෙන් රූපකාය ධර්මකායට මුල් හෙයින් රූපකාය අනුස්මරණය කොට ඒ අනුස්මරණ කුශලය සත්වයන්ට පිරිනමා එයින් හිතාසිංශන වශයෙන් මෛත්‍රිය කරන්නා වූ ශාසන ප්‍රසාදක ශ්‍රී බුද්ධප්‍රියාචාර්යයන් විසින් බුදුරදුන්ගේ තියෙහි පටන් වර්ණනාද්වාරයෙන් පජ්ජමධුව රචනා කරන ලද බව ප්‍රථම ගාථාවෙන් ම අවධාරණය කෙරේ. 'ශ්ලෝක රස නැමැති මධුව' හෙවත් පද්‍යයන් පිළිබඳ මී වදයකැයි යනු මෙයට අන්වර්ථ වශයෙන් ම දී ඇති නාමයයි.[42]

මෙය බුද්ධ ගුණ දීපකයකි. බුදුන් වහන්සේගේ ඌර්ණ රෝමාදී නොයෙක් ශරීර අවයවයන් ද සිරි පතුල්හි



පිහිටි මංගල ලක්ෂණයන් ද වර්ණනා කරමින් පබැඳුනෙකි. මේ ගුණ වැයීම මධුවක් මවන බැවින් ශ්‍රොතෘ ජනයාට අවසානයේ දී සිහිපත් කරනුයේ මෙය පානය කරන ලෙසයි.[43] ග්‍රන්ථයෙහි මුඛ්‍ය පරමාර්ථය බුදුන් වහන්සේගේ ගුණ ප්‍රශංසා මුඛයෙන් වර්ණනා කිරීමයි. සමස්ත කෘතියෙන් ම කතුවරයා බුදුරදුන්ගේ රූපකාය පිළිබඳ ඉතා උත්කෘෂ්ට චිත්‍රයක් මවාපායි. බුද්ධ ගුණ මෙහි පුන පුනා කතා කෙරෙන මාතෘකාවයි. පූජනීය වූ අසහාය දෙවියා අන්‍යොන්‍ය සම්බන්ධතාවෙන් යුතු සමස්ත පෞරුෂමය ලක්ෂණවලින් යුක්ත වූවෙකි. මෙම කෘතියට අනුව බුදුරදුන් ප්‍රාර්ථනාවන් සමෘද්ධ කරන්නෙකි. විමුක්තිය පිළිබඳ උසස් අරමුණකි. චිරස්ථායි ආත්මයෙකි. විමුක්ති මාර්ගය දන්නවුන් අතර ප්‍රධානය. දෙවිමිනිසුන් සහිත මුලු ලෝකය පාලනය කරයි. ගුරුවරයා ද යහපත් මනස (ආධ්‍යාත්මය) විහිඳුවන ආලෝකය ද වේ.[44] ඩී.ජී. කපර්කාර් පජ්ජමධුව පිළිබඳ හැඳින්වීමේ දී ''මෙම කෘතියේ කතුවරයා භක්තිවාදය අනුගමනය කරන්නෙක් හා පෞද්ගලික දෙවියන් අදහන්නන් අතර අතිශයින් ජනප්‍රිය වූ සංස්කෘත ස්තෝත්‍ර සාහිත්‍ය අනුකරණය කිරීමට අවශ්‍ය වී ඇත්තෙකි, මහායාන භක්තිවාදීන් අතර බුද්ධදේවත්වාරෝපණය සම්පූර්ණ වූ අතර පශ්චාත් කාලීන හින්දු පුරාණවල බුදුරදුන් විෂ්ණු වශයෙන් ද, භගවත් ගීතාවේ බුදුරදුන් විෂ්ණුගේ නවවෙනි අවතාරය වශයෙන් ද ඇතුළත් කර තිබේ, මෙබඳු පසුබිමක් යටතේ ප්‍රතිමා වන්දනය ද ජනප්‍රිය වූ බව පෙනේ'' යැයි දක්වයි.[45] මධුර මනෝහර කාව්‍ය ලක්ෂණයෙන් සමන්විත වූ මේ කාව්‍ය බුදුන් වහන්සේගේ ධර්මය වර්ණනා කරනු ලබන ශ්‍රේෂ්ඨ

ග්‍රන්ථයන් අතුරට ඇතුළත් වන අතර මාහැඟි ධර්ම කාරණයන්ගෙනුත් විශේෂයෙන් ඡන්දෝලංකාරයන්ගෙනුත් අලංකෘත වූ ත්‍රිවිධරත්නයේ ගුණානුස්මරණය හා මෛත්‍රී භාවනා ප්‍රගුණ කරනු කැමති සාධු සජ්ජනයන්ටත් මාගධී භාෂා ප්‍රගුණ කිරීමෙහි ලා රුචියක් දක්වන්නවුන්නටත් ඡන්දෝලංකාර නිදර්ශනයන් දැනගනු කැමති අයටත් අතිශයින්ම උපකාරී වූත් විද්වතුන් විසින් සම්භාවනා කටයුතු වූත් මාහැඟි ධර්ම ග්‍රන්ථයකි.

**අන්තර්ගතය: පද්‍ය අනුපිළිවෙළින් සාරාංශව**

**පජ්ජමධුව** සම්පූර්ණයෙන් ම ගාථා මාධ්‍යයෙන් පමණක් රචනා වූවෙකි. ග්‍රන්ථයෙහි අන්තර්ගත මුළු ගාථා ප්‍රමාණය 104 කි. පජ්ජමධුවේ දක්නට ලැබෙන විශේෂ ලක්‍ෂණයක් නම් වෙනත් ග්‍රන්ථයන්හි පූර්වයෙන් නමස්කාරය සිදු කෙරෙන මුත් මෙහි තම කාව්‍යයේ අරමුණ මුලින්ම සඳහන්කොට ත්‍රිවිධ රත්නයට ග්‍රන්ථාවසානයෙහි ආශිංසනය කිරීමයි. මුලින් ම සර්වඥයන් වහන්සේගේ පාද ලක්‍ෂණය නියෙහි පටන් දේශනා කිරීමට කතුවරයාට උද්දේශ ලැබී ඇත. **'දේවතානං රූපං පාදං ගුෂ්ඨාත් ප්‍රභෘති වර්ණ්‍යතෙ මනුෂ්‍යානම් කේශාධාරභ්‍යෙති ධාර්මිකඃ'** ඒ අනුව දෙවියන්ගේ රූපය මාපටඟිල්ලේ පටන් ද, මනුෂ්‍යයන්ගේ වර්ණනා කේශයෙහි පටන් ද, ධාර්මිකය ආප්ත වචනානුකූලව ද විශුද්ධිදේව වූ බුදුරදුන්ගේ වැණුම නියෙහි පටන් වර්ණනා කිරීම සිදුවී ඇත.



දෙවෙනි ගාථාව ද බුදුරදුන්ගේ අංගුලි ස්තුතියට වෙන්කර ඇත. බෝ මුල බුදුරදුන් සම්බෝධියට ප්‍රාප්තව වැඩහුන් කල්හි බුද්ධත්වයට පත්වීමට ඉඩ නොදෙමියි යුදයට පැමිණි මාරයා ආයුධ වර්ෂා හෙළීමෙන් කළ යුද්ධය විවරිතය. ඒ ආයුධ බුදුන් කරා පැමිණ මල් වැසි ලෙසින් බුදුසිරිපා මුල වැටුනි ද ඒ සියල්ල මාරයාට විරුද්ධව ශ්‍රී පාද භජනය කිරීමෙන් මාරයා පරදවා බුදුරදුන්ට ජයගෙන දුන්නාහු ද එහෙයින් **"පරිවත්‍ය සතු පාදස්සයා ජිතදිසාය"** යැයි කියූ ආකාරයෙන්ම අංගුලි ස්තුතිය ද එම වර්ණනා මුඛයෙන්ම ආශ්චර්යවත් ව මාර පරාජය ද අනුස්මරණය කෙරේ. බුදුරදුන්ගේ රන්වන් සිරුරත්, නෙළුම්පතක හුනු දිය බිඳක් සේ රජස් නොඇලෙන සියුම් සිවියත් මනාව වැසුන සිරාජාලත් රන්වන් මිරි වැඩිසෙයින් එක පැහැර නැඟෙන සියක් වට පෙළ පුළුන් පොදක් සේ සුකෝමළ මනාව පිහිටි ශ්‍රී පාදයත් එයින් වර්ණනා කෙරේ. ගමනයෙහි යෙදෙන බුදුරදුන් නෙළුම් මත නෙළුම් පිහිට වූවාක් වැනි සිරිපතුල් අග පැවති ආශ්චර්යත්වයෙන් යුත් මෙබඳු වූ බුදුරදුන් ලෝකයා විසින් පුදනු ලබන ආමිස ප්‍රතිපත්ති පූජාවන්ට පාත්‍ර වන බවත් එය ප්‍රකාශ කරණු පිණිස මැවීමෙහි දක්ෂයකු විසින් හෙවත් පාරමිතා සංඛ්‍යාත කුසල කර්ම නැමැති ශිල්පියා විසින් මවන ලද්දාක් වැනි අටෝරාශියක් (108 ක්) මංගල ලක්ෂණයන්ගෙන් ශ්‍රී පාදය පිරිපුන් බවත් සිහිපත් කරයි.[46]

සර්වඥයන් වහන්සේගේ . ශ්‍රී පාදය මංගල ලක්ෂණයන්ගෙන් යුක්ත අතරම ඒවා තමා ඇසුරු කරන

සියල්ලවුන්ගේ මාන දර්ප බිඳ පාපිට හෙළා ගැන්ම ද එයින් ම ඔවුන්ට යහපත ද සිහිපත් කෙරේ. බුදුරදුන්ගේ සිරිපා වඳින ජනයන්ගේ පිළිබිඹුව සිරිපා මත වැටෙන නිසා ඒවා සියල්ලන් විසින් දෙනලද පිළිබිඹු ඇති කැඩපතක් වැනි යැයි අනතුරුව අතිශයෝක්තියෙන් වර්ණනා කරයි. බුදුරදුන්ගේ සිරිපතුලෙහි සක් ලකුණු දෙකක් (චක්කා) පිහිටයි. ඒ ඒ චක්‍රයෙහි දහසක් බැගින් දැව් ඇත. නෙමි ද නාභි ද නැබ වට සිටි රේඛා ද නැබ මුව වට සිටි වට ද, ප්‍රණාලි මුඛය, දැව්යෙහි වට රේඛා ද, නෙමි මිණි ද යන සක් රුවන පිළිබඳ සියලු අවයව 9 වැනි ගාථාවෙන් සිහිපත් කරයි.[47] සක්විති රජහට එක් සක් රුවනක් ද බුදුරදුන්ගේ සිරිපතුල්හි සක් රුවන් දෙකක් පහළ වූවාක් සේ බබළන බවත් වර්ණනා කරයි. මෙසේ පළමුව චක්‍ර රත්නය සක්විති රජහට ද පහළ වන රත්න හත අතුරෙන් එකක් බැවින් ගෞතම බුදුරදුන් පාරමිතා ධර්ම පුරන කාලයෙහි එක් ජන්මයක සුදර්ශන නමින් සක්විති රජෙක් වී සිටි බවත් ඒ අවධියේ දී චක්‍ර රත්නය පහළ වූ ආකාරයත් දහවැනි ගාථාවෙන් සිහිපත් කරයි. මේ අයුරින් සිරිපතුල්හි වර්ණනා කරන මංගල ලක්ෂණ සංක්ෂිප්තව මෙසේ සඳහන් කළ හැක.

චක්‍රරත්නය (චක්කා), ශ්‍රී අංගය (සිරිවච්ඡකො), ස්වස්තිකය (ස්වස්ති), දක්ෂිණාවර්තය (නන්දවත්ති), අවතංසකය (අවතංස), භද්‍රපීඨය (භද්දපීඨං), පුන්කළස (පුණ්ණකුම්භො), පූර්ණපාත්‍රි (පාති), ශ්වේතච්ඡත්‍රය (සෙතාතපත්ත), කඩුව (ඛග්ගො), තාලවන්ත සහිත විජිනිපත (සතාලවණ්ට සංවීජනී), මයුර හස්තය (මොරහත්‍ථො),



අංකුසය (අඞ්කුසො), ප්‍රාසාද ලක්‍ෂණ (පාසාද), උෂ්ණීෂකය (උණ්හීස), උත්පල (උප්පල), මාණික්‍ය (මණි), පද්මය (පදුම), සමුද්‍රය (සමුද්දො), මේරු පර්වතය (මෙරු), චක්‍රවාට පර්වතය (චක්කවාළසිඛරී), හිරු (සූරො), සඳ (චන්‍දො), නක්‍ෂත්‍ර (නක්ඛත්ත), සක්ලකුණ (චකකං), ධජය (ධජො), මහාවිජයොත්තරසක (මහාවිජයුත්තරාක්ඛ්‍යං සංඛං), ස්වර්ණ මත්ස්‍ය යුගල (සොවණ්ණ මච්ඡයුගලං), කිඹුල් ලකුණ (කුම්භීලදග්ගහිතතො), සප්ත මහාගංගාවෝ (සත්තාපගා), සප්ත මහාවිල් (දහා ච සත්ත), සප්තකූට පර්වත (සෙලාවසත්තං), පතාකා (පතාකා), පටඞ්කි (පටඞ්කි), සෙමෙර (චාමර), කේසරසිංහ (මිගින්ද), ගුරුළු රජ (සුපණ්ණරාජ), වළාහක අශ්වරාජ (වළාහක අස්සපති), ඡද්දන්ත ඇත්රජ (ඡද්දන්ත), උපොසථ හස්තිරාජ (චරණූපොසථ හත්‍ථිරාජ), කෛලාස පර්වත ප්‍රතිමාව (කෙලාස සෙලපටිමා), හංසලකුණ (පාදහංස), ඓරාවණ හස්තිරාජ (එරවනො කරිවරො), වාසුකි නම් නාගරාජයා (වාසුකි නාගරජො), මයුර රාජා (මොරරාජං), චතුර්මුඛ ස්වර්ණ නෞකා (චතුමුඛ හෙම නාවා), කරවීක පක්ෂියා (කරවීක පක්ඛි), සක්වාළිහිණියා (චක්කවාක), මකර ලක්ෂණය (මකරා), කොස්වාළිහිණියා (කොඤ්ච), ජීවංජීව (ජීවජීව), කිංපුරිස (කින්නර), කින්නරාංගනා (කින්නරී), වෘෂභ රාජයා (උසභො), වස්සා සහිත ධෙනුව (සවච්ඡධෙනු), ෂොඩ්ෂ බ්‍රහ්ම ලෝක (සොළස ධාතුධාම), සත්ව රූප (පදසත්ත රූපා) වශයෙනි.

මේ අයුරින් පළමු ගාථාවේ සිට 39 වෙනි ගාථාව දක්වා ශ්‍රී පාදයෙහි අටෝරාශියක් මංගල ලක්ෂණයන්

වර්ණනා කිරීමෙන් අනතුරුව දෙතිස් මහාපුරුෂ ලක්ෂණයන් අතුරෙන් ජඞ්ගායුග්මය වර්ණනා කරයි. ඒ බුදුරදුන්ගේ නියෙහි පටන් වර්ණනාව සිදු කෙරෙන බැවිනි. ගාථා 40 සිට 69 දක්වා ගාථා 29 කින් බුදුන් වහන්සේගේ දෙතිස් මහාපුරුෂ ලක්ෂණත් අසූවක් අනුව්‍යංඤ්ජනයෝත් සම්මිශ්‍රිතව වර්ණනා කරයි. එහි දී කතුවරයා එක් නාමයක් සඳහන් කිරීම පමණකින් ඒ තුළට මහාපුරුෂ ලක්ෂණත් අනුව්‍යංඤ්ජනයෝත් ඇතුළත් කොට ඇති බව දැකිය හැකිය. 'උණ්ණාභමුකන්තරොජතා'[48] යන්නෙන් මහා පුරුෂ ලක්ෂණයක් වන ඌර්ණරෝමයත්, සුසණ්ඨානභමුකතා, සණ්හභමුකතා, අනුලෝමභමුකතා, මහන්තභමුකතා, ආයතභමුකතා යන අනුව්‍යඤ්ජනයෝ 5 ත් වර්ණනා කිරීම එයට එක් නිදර්ශනයකි. මේ අයුරින් ගාථා 69 ක් කතුවරයා වෙන් කොට ඇත්තේ බුදුන් වහන්සේගේ රූපකාය වර්ණනා කිරීමට යි. රූපකාය වර්ණනා කිරීමෙන් අනතුරුව දස පාරමිතාවෝ පූරණය කළ බුදුන් වහන්සේගේ රූපකාය හා නාමකාය ප්‍රණිධියෙහි පටන් පිරිසිදු කොට අවසාන ආත්මය රූපකාය ද ධර්මකාය ද පූරණය කළා මෙන් ජනයාගේ උභය ආත්මයන් සම්පූර්ණ වූවන් කෙරෙත්වායි ප්‍රාර්ථනා කරයි.

කතුවරයා 54 වෙනි පද්‍යයේ දී මෙබඳු විස්තරයක් ඉදිරිපත් කරයි. ''ඔබේ මදක් රතු වූ දෙතොල් මිනිසුන්ගේ පාපයන් යටපත් කරනු ලැබේවා. කෙබඳු දෙතොල් ද යත්, සාගරයේ අතිශයින් චමත්කාර ජනක කොරල් ලතා යුවලකට අයත් අලංකාරය ඇති බුද්ධ ශරීරය නැමැති කල්ප වෘක්ෂයේ හටගත් රිකිල්ලක බඳු කාන්තිය ඇති රක්ත



පද්මයන්ගේ මකරන්දයන් පරදවන ලද සිත්කලු වූ දෙතොල් මිනිසුන්ගේ පාපයන් යටපත් කරනු ලැබේවා''[49] යනුවෙනි.

රූපකාය නම් රූපයයි. චිත්ත චෛතසික නාමකාය නම් වේ. මූල ප්‍රණිධියෙහි පටන් මනහර ලෙස රූපකාය ද, ආශ්චර්ය එළවන ගුණයන්ගේ උත්පත්තිය ඇති කොට චිත්තය ද පුරා අවසාන ආත්ම භවයෙහි ඉහත විවරණය කළ අයුරින් දෙතිස් මහාපුරුෂ ලක්‍ෂණයන්ගේ ද ඒ ලක්‍ෂණ අනුව ගිය ලක්‍ෂණ ප්‍රකාශය හා ශරීර ශොභා සුප්‍රකට කරන්නා වූ අසූවක් අනුව්‍යංඤ්ජන ලක්‍ෂණයන්ගෙන් ද පිරිපුන්ය.

සර්වඥතා ඥානය ද ලෝකෝත්තර ඵලය ද ලබාදෙන්නා වූ දස පාරමිතාවෝ ධර්මකාය යටතේ මුලින්ම වර්ණනා කෙරේ. පාරමිතා ගුණ නැමැති චන්ද්‍රයා බෝසතුන් නියත විවරණ ලත් දිනයෙහි පටන් බුදු වූ වෛශාඛ පුන් පොහොය තෙක් කාල සංඛ්‍යාත කුශල පක්‍ෂයෙහි ක්‍රමයෙන් වැඩී මුළුලොව නිර්වාණ නැමැති අමෘත රශ්මීන් ස්පර්ශ කරවා ප්‍රබෝධමත් කළා සේ ජනයා ප්‍රබෝධ කෙරේවායි 72 වෙනි ගාථාවෙන් ප්‍රාර්ථනා කරයි. මෙහිදී ගාථා 13 කින් දස පාරමිතාවෝ අනුස්මරණය කෙරේ. මූලප්‍රණිධියෙහි පටන් පුරුදු කළ දාන සීලාදි පාරමිතාවන් සඳහා එක් පාරමිතාවකට එක් ගාථාව බැගින් වෙන්කරමින් වර්ණනා කරයි.

තුසිත දිව්‍යලෝකයෙහි නොයෙක් මහලින් යුක්ත වූ විමාන ද නව අරහාදී බුදුගුණයෙන් යුක්ත වූ ආශ්චර්ය

සම්පන්න වූ හෝ කුසල හේතූන්ගේ විවිධාකාරයේ වැඩීම් ඇත්තා වූ සර්වඥ නැමැති ප්‍රාසාදයට පාරමිතා නමැති සෝපාන මාලාවෙන් නැංගා සේ පාරමිතා අවසානයේ සිහිපත් කර අනතුරුව නව අරහාදී බුදු ගුණයන් ආශංසනය කරයි.[50] සියලු මිනිස්සු ශාන්ත භාවය මුලුමනින් ම අවබෝධ කර ගත්, ඥාණ සම්භාරයකින් හා මනා මඟපෙන්වීමකින් යුක්ත වූ, අතිශයෙන් ප්‍රවීන වූ, ලෝකය දන්නා වූ, දක්ෂ රථාචාර්යයෙක් වූ, බුද්ධත්වය ද, පූජ්‍යත්වය ද ලැබූ තැනැත්තා වූ ඔබ කෙරෙහි පැහැදෙති'යි බුදුන් වහන්සේ කෙරෙහි පැවැති අචල භක්තිය විවරණ කරයි.

නව අරහාදි බුදු ගුණයන් එක ගාථාවකින් වර්ණනා කිරීමට කතුවරයා සමත් වේ. මෙම නව ගුණ නැමැති නව රත්නය ජනයා විසින් තමන්ගේ සිත් නැමැති පොළොවෙහි නිදන් කිරීමෙන් දුක් නමැති ගිණි බිය, සොර බිය, ජල බිය, මං පැහැරීම් ආදියෙන් පෙළුණු භව නමැති ගෘහයෙහි එබඳු ආපදාවක් පැමිණි කල්හි ජනයාට ආරක්ෂාවක් වන බව සිහිපත් කරයි.[51] නව රත්නාවලිය නාමකාය රූප කාය (සිත කය) දෙකෙහි ශ්‍රවණයෙන්, ධාරණයෙන්, පිළිපැදීමෙන්, සියලු ශරීර විරූපතා, ක්ලෙශ විරූපතා සමනය වී ශ්‍රී සම්පත්තිය හා එක් වී අභිවෘද්ධිය පිණිස හේතුවන බව අවධාරණය කරයි.[52] බුද්ධගුණානුස්මරණයෙන් ඓහලෞකික, පාරලෞකික ඵල ලබාදෙන ආකාරයත්[53] අපාදොරටු වැසී නිවන් දොරටු විවර වන ආකාරයත්[54] අනතුරු ගාථාවලින් විවරණය කරයි. මෙසේ 70 සිට 88 දක්වා වූ ගාථා 19 කින් දස පාරමිතාවන්



සහ නව අරහාදි බුදු ගුණයන් වෙනුවෙන් සිදුකළ ධර්මකාය පිළිබඳ වර්ණනාව අවසන් කෙරේ.

## බුදුරදුන්ගේ ආශ්චර්යමත් චරිතය

පූර්ව බුදුවරුන්ගේ නියත විවරණ ලැබීම, ප්‍රකෘතිය, කරුණා ගුණයෙන් යුක්ත වීම, පරාර්ථ චර්යාවේ යෙදීම හා දුෂ්කර ක්‍රියාව, කළණ මිතුරන් ඇති වීම යන හේතු අවස්ථාවන්හි දස පාරමිතාවෝ පූරණය කොට සර්වඥතා ඥානය ලබා ගත් ආකාරය විවරණය කරමින් හේතු දසා, ඵල දසා සමව පැවතීම හැමකල්හි ම ලෝකාර්ථ, ඥාතාර්ථ සහ බුද්ධි චර්යාවෙහි පැවතීමෙන් බුදුරදුන්ගේ මහිමය ලොව කිසිවකු හා සමකළ නොහැකි බැවින් බෝසත් චරිතය අද්භූත ආශ්චර්යමත් බව වර්ණනා කරයි. බෝසතුන්ගේ මෙකී චරිතාද්භූතයන් ස්මරණය කිරීම පිණිස දිසා මාත්‍රයක් දක්වයි. කදිරංගාර ජාතකය, සස ජාතකය, වත්සා රාජ්‍ය සත්‍යක්‍රියාවෙන් වැසි වැස්ස වීම, විශාලාවේ තුන්බිය රුවන් සුතුරෙන් සංසිඳවීම, ඡද්දන්ත හස්තිරාජයා සෝණුත්තර වැද්දාට තම දළ සිඳ ලබාදීම, තේමිය කුමරුගේ අධිෂ්ඨාන බලය නිසා සක් දෙව්ඳු දොළොස් යොදුන් කර මැවූ මළුවෙහි රන් රිදී වැතිරුවා සේ බුදුරදුන්ගේ සිරුරේ විසිරුණු ධාතූහු ද, රාම පුවතෙහි මිරිවැඩි සඟල රජ සේ සැළකූ සේක් ද තපස්සු භල්ලික පිළිගැන් වූ මී පිඩු, පාත්‍රා සතර එකක් සේ අධිෂ්ඨාන කර පරිනිර්වාණය තෙක් එයින් වැළඳූ අයුරුත් තුණ්ඩිල දෙසූ දහම සැට දහසක් අවුරුදු මුළුල්ලේ පැවතියා සේ බුදුන්

වදාළ ත්‍රිපිටක ධර්මය ජන සමූහයාට බොහෝ කලක් හිතසුව පිණිස පවතින බවත් ආදී ශාසනික ඉතිහාසමය තොරතුරු ඉදිරිපත් කරමින් බුද්ධ භක්තියාවහ වර්ණනාව සිදුකරයි. බුදුවීම පිණිස බෝ මුල විදුරසුනෙන් වැඩවුන් බුදුරදුන්ට බුදුවීමට ඉඩ නොදෙමියි එළැඹි වසවත්මරු පරදවා බුද්ධත්වයට පත් වූ සේක් ද, ඒ බෝධිද්‍රැමය දැන් වුව ද භජනය කළා වූ ජනයාගේ හිත සුව පිණිස, ස්වර්ග මෝක්ෂ පිණිස හේතු වන බව සිහිගන්වයි.[55]

ඉහත වර්ණනා කළ සකල බුද්ධ ගුණයන් ආශිංසනය කිරීම ද, සර්වඥ නමැති පර්වතාභ්‍යන්තරයෙහි වක්ත්‍ර නමැති අනවතප්තයෙන් නික්ම සූත්‍ර, විනය, අභිධර්ම යන තුන් අයුරකින් පැවැති හෙවත් සීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිශික්ෂාවන්ගේ පැවැතියා වූ භික්ෂු නමැති සාගරයෙහි පිහිටියා වූ ධර්ම ශබ්ද වශයට හෙවත් කර්ණ රසයට පිවිසූවක් පවිත්‍ර කරන්නා වූ ධර්ම නමැති ගංගාව බෝධි සම්භාර නමැති ශස්‍ය මුහුකරමින් මේ ලෝකයෙහි පවතීවා යන පර්යාප්ති ධර්ම ස්තුතිය මඟින් ආශිංසනය කරයි. ''ඔබගේ ධර්ම නැමැති ගංගාව පොළොව මත ගලා පාරමිතා ස්වරූප වූ අස්වැන්න වර්ධනය කෙරේවා, ශ්‍රාවක සමූහයා තුළම අන්තර්ගත වූ සියලු දෙනා පිරිසිදු බවට පමුණුවන බුද්ධත්වය පමණක් වූ හිමාල කඳු පන්තියේ පිහිටා ඇති ඥාණ සම්භාරය නැමැති මුහුදට ගලන ධර්මය නැමැති ගංගාව මේ නිසා සියලු සම්මානයන්ගෙන් යුක්ත වේ'' යනුවෙනි.[56] ප්‍රතිපත්ති නමැති නෞකාව උතුම් ශ්‍රද්ධා දී සප්තාර්ය ධන ඇති ජනයන් සසර සයුර පරතර යැයි කියන ලද නිවන්



නමැති සුන්දර වූ පත්තන ග්‍රාමයට පැමිණ වීම් වශයෙන් ප්‍රතිපත්ති ධර්මයෙන් ආශංසනය කරයි. ප්‍රතිපත්ති ධර්ම ස්තුතියෙන් අනතුරුව ප්‍රතිවේධ සද්ධර්මය අනුස්මරණය කරමින් සප්ත බොජ්ඣංගය ශ්‍රාවක රත්නයන්ට ආකර වූ සුවාසු දහසක් ධර්මස්කන්ධ නමැති ගැඹුරු වූ ජලස්කන්ධය ඇති පර්යාප්ති, ප්‍රතිපත්ති හා ප්‍රතිවේධ වූ සද්ධර්ම නැමැති සාගරය සෞශීල්‍ය ගුණ නැමැති අනන්ත නාග රාජයාගේ දරණවැලින් වෙළන ලද ඥාන නැමැති මන්දිර පර්වතයෙහි ඇසුරු කළවූවන්ට නිර්වාණය ඒකාන්තයෙන් දෙවාවයි එහි අවසානයෙහි සිහිපත් කරයි.[57]

ශාසන මුඛයෙන් නිර්දේශිත ත්‍රිවිධ සද්ධර්මයෙහි නිර්වාණය ඇතුළත් නොකළ නිසා අනතුරුව නිර්වාණය ආශංසනය කෙරේ. ''ප්‍රතිපත්තියෙහි නැමුණු විශිෂ්ට ප්‍රඥා ඇත්තා වූ විසින් පූර්වයෙහි කරන ලද උපනිඃශ්‍රය හේතුවෙන් ලබන ලද නිර්වාණ නැමැති අමෘතය සත්වයා ජරාමරණාදි දුක්ඛයෙන් සමනය කෙරේවා''[58] යනු එයින් සිදුකෙරෙන ප්‍රාර්ථනයයි.

දශවිධ ධර්ම ස්තුතියෙන් අනතුරුව අෂ්ටාර්ය පුද්ගල සංඝයා ආශංසනයට නතු කෙරේ. සුන්දර ස්වභාවයෙන් ද ගුණයෙන් ද සාධු ජනයා තමා කෙරෙහි යොමුවන හෙයින් ද සද්ධර්ම රශ්මියෙන් ප්‍රබෝධ වූ ධුතාංගයන්ගෙන් සමන්විත වූ සංඝ සමූහයා ලෞකික, ලෝකෝත්තර සුව සම්පත් දෙවාවයි සංඝරත්නය ස්මරණය කෙරේ.[59]

මේ අයුරින් ප්‍රඥා සංවර්ධනයට හේතු වූ සත්පුරුෂ ඇදුරෙකුගේ ඇසුරෙන් සහ නිතර සත්ව අනුස්මරණයෙන් සංවර්ධිත වූ ඥානවන්තයෙක් විසින් මේ පද්‍ය බන්ධනය නිෂ්පාදිත යැයි දැක්වීමෙන් සත්වයන්ට එහි සාදර සේවන වශයෙන් හිතාශංසනය සිදුකරයි. හිතාශංසන අදහසින් සියලු හිත සිද්ධිය මූලික කාරණ හෙයින් බුදුන් කෙරෙහි භක්තිය ද, බුදුන්ගේ කල්‍යාණ මිත්‍ර සංඛ්‍යාත සත්පුරුෂ සමවාය මූලකරණ හෙයින් සදාචාරයන් කෙරෙහි භක්තිය ද අවශ්‍යයෙන් කටයුතු බව දක්වයි. එහෙයින් තමාටත් අන්වර්ථ නාමයක් වශයෙන් ආනන්ද යන පදය යොදමින්, **ආනන්දරඤ්ඤරතනාදී** මහා යතින්ද වශයෙන් 103 වැනි ගාථාව ආනන්ද වනරතන මහා ස්ථවිර නමැති ශ්‍රැතමය, ඥාන ස්වභාව වූ ඥානයෙහි නිතර විකාශයට පැමිණියා වූ ප්‍රීතිය පෙරටු කොට සේවනය කරන බව දක්වයි. නිරන්තර ඥානය සහ බහුශ්‍රැතාදි ගුණයෙහි ප්‍රිය වූ ඔහු අතිශයෙන් බුදුගුණයෙහි ප්‍රිය වූ බුද්ධප්‍රිය නම් වූ ස්ථවිර නමැති භෘංගයා විසින් බඳනා ලද පද්‍ය නමැති මධුව සත්වයන් නිරන්තරයෙන් බොනු ලැබේවායි **බුද්ධප්පියෙන ඝණබුද්ධගුණප්පියෙන ථෙරාලිනා රචිත පජ්ජමධුං පිබන්තු** යනුවෙන් කර්තෘ නාමයත් ආචාර්යවරයාත් සඳහන් කරයි. අවසානයේ දී තමා විසින් ග්‍රන්ථ රචනයෙන් රැස් කරන ලද අතිවිශිෂ්ට කුසලය තෘෂ්ණාදියෙන් කිළිටි නොකොට මතු මත්තෙහි දූ වඩාත් කිළිටි නොවීමට පතන්නා වූ හේතු වර්ධනයෙන් ලොව්තුරා ඵලයම වඩනු පිණිස **ඉච්චං රූපගුණානුකිත්තනවසා තං තං හිතාසිංසතො** යන නිගමන ගාථාවෙන් පජ්ජමධුව නිමාවට පත් වෙයි.



### සමස්ත පද්‍යමාලාවේ අන්තර්ගතය සංක්ෂිප්තයෙන්

01 සිට 69 දක්වා බුදුන් වහන්සේගේ රූපකාය වර්ණනා කිරීම, 70 සිට 88 දක්වා ධර්මකාය වර්ණනා කිරීම, 89 සිට 91 දක්වා සර්වඥයන් වහන්සේගේ හේතු අවස්ථා සහ ඵල අවස්ථා දෙකෙහි පැවතියා වූ චරිතාද්භූත ස්මරණය, 92 සිට 96 දක්වා බුදුන්වහන්සේගේ අනුපදිශේෂ පරිනිර්වාණයෙන් මෑත ජනාභිවෘද්ධි කර වූ චරිතාද්භූතයන් හා තත්සදෘශ පූර්වාවදානයන් ස්මරණය, 97 සර්වඥගුණ, 98 පර්යාප්ති ධර්මය, 99 ප්‍රතිපත්ති ධර්මය, 100 ප්‍රතිවේධ ධර්මය, 101 නිර්වාණය, 102 අෂ්ටාර්ය පුද්ගල මහා සංඝරත්නය, 103 බුදුන් කෙරෙහි ද, ස්වකීයාචාර්යන් කෙරෙහි ද, ප්‍රකරණ කර්තෘන්ගේ භක්තිය ද, ස්වකීය ගුරු සන්දර්ශනය හා ආත්ම සන්දර්ශනය ද, ග්‍රන්ථ නාමය ද පැවසීම සහ අවසාන 104 ගාථාවෙන් නිගමනය ඉදිරිපත් කෙරේ.

### සමෝධානය

චෝළීය බුද්ධප්පිය තෙරුන් විසින් රචිත පජ්ජමධු කාව්‍ය පාලි කාව්‍ය සාහිත්‍යයෙහි ඉතා විශිෂ්ට නිර්මාණයකි. එසේම මෙය බුදුරදුන් පිළිබඳව හා ධර්මය පිළබඳව වර්ණනා මුඛයෙන් රචනා කරන උසස් පද්‍යමය ධර්ම ග්‍රන්ථයකි. සම්බුද්ධ ශරීරයෙහි පිහිටි මහා පුරුෂ ලක්ෂණවලට අතිරේකව උපලක්ෂණ වශයෙන් ලක්ෂණ 80 ක් අනුව්‍යංජන විවරණය

කිරීම විශේෂයෙන් දැකිය හැකි ලක්‍ෂණයකි. ථෙරවාදී සම්ප්‍රදායෙහි අනුව්‍යංඤ්ජන වශයෙන් හැඳින්වුවත් අසීති අනුව්‍යංඤ්ජන වශයෙන් සඳහන් කිරීමක් හමු නොවන අතර ලලිතවිස්තරය වැනි පශ්චාත් කාලීන සම්ප්‍රදායයන්හි මෙම මහාපුරුෂ සංකල්පය සංවර්ධනය වන්නට ඇත. බුදුන්වහන්සේගේ ශාරීරික විශිෂ්ටත්වය හා සර්වඥ භාවයේ විශාරදත්වය ප්‍රකට කිරීම සඳහා දෙතිස් මහාපුරුෂ ලක්‍ෂණ ප්‍රමාණවත් නොවූයෙන් අසීති අනුව්‍යංඤ්ජන නමින් තවත් ශාරීරික ලක්‍ෂණ සංග්‍රහයක් ආරෝපණය කරන්නට ඇත. ඒ අනුව පජ්ජමධුවේ දී විස්තෘත අසීති අනුව්‍යංඤ්ජන එක් එක් මහාපුරුෂ ලක්‍ෂණයන් සවිස්තරව විවරණය කිරීම සඳහා දැරූ පශ්චාත් කාලීන ප්‍රයත්නයක ප්‍රතිඵලයක් යැයි නිගමනය කළ හැකිය.

පජ්ජමධුවේ අර්ථාලංකාරය, ශබ්දාලංකාරය උත්පාදනය කරනු වස් ග්‍රන්ථ රචකයා උපමා, රූපක, දීපක, උත්ප්‍රේක්‍ෂා, ශ්ලේෂ, නිදර්ශන, හේතු ආදී අලංකාර රාශියක් ද යමකාදි කාව්‍ය ලක්‍ෂණයන් ද අන්තර්ගත කරමින් තම කෘතිය කාව්‍යය අලංකාරයන් අන්තර්ගත කරමින් කාව්‍ය ලක්‍ෂණයන්ගෙන් ප්‍රතිමණ්ඩිත ග්‍රන්ථයක් ලෙසින් රචනා කිරීමට සමත් වී ඇත. ඒ අනුව පජ්ජමධු කාව්‍යය මධුර, මනෝහර කාව්‍ය ලක්ෂණයන්ගෙන් සමන්විත මාහැඟි ධර්ම කාරණයන්ගෙන් සහ ඡන්දෝලංකාරයන්ගෙනුත් යුක්ත බුද්ධස්තෝත්‍ර කෘතියෙකැයි කිව හැකිය.



## ආන්තික සටහන්

1. පාලි සාහිත්‍ය ඉතිහාසය, පරි. හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 671, කොළඹ 10, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය, ප්‍රථම මුද්‍රණය, 2003, 496 පිටුව.

2. වික්‍රමසිංහ, මාර්ටින්, ථේරි ගී, මවුන්ට් ප්‍රකාශකයෝ, නාවල, රාජගිරිය, තෙවන මුද්‍රණය, 1966, ප්‍රස්තාවනා.

3. සන්නස්ගල, පුඤ්චිබණ්ඩාර, සිංහල සාහිත්‍ය වංශය, රජයේ මුද්‍රණාලය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 1994, 125, 180 පිටු.

4. පාලි සාහිත්‍ය ඉතිහාසය, 497 පිට.

5. පජ්ජමධු, සංස්. හක්මන සිරි සංඝතිස්ස, ප්‍රස්තාවනා.

6. Encyclopedia Of Buddhism, vo.III, The Government Of Ceylon, 1971, pp. 459 – 460

7. Jayawardana, Somapala, Hand Book Of Pali Literature, Karunaratna and Sons Ltd, Colombo 10, Frist edition, 1994, p. 106

8. විඛ්‍යාතා නානාථෙරවිහය වරගුරූනං තම්බපණ්ණිද්ධජාතං සිස්සො දීපඞ්කරාඛ්‍යාදි දමිළ වසුමති දීපලද්ධප්පකාසං බාලාදිච්චාදි වාසදවිත්‍ය මධිවාසං සාසනං ජොතයි සො සො'යං බුද්ධප්පියව්හො යති ඉමමුජුකං රූපසිද්ධිං අකාසි, මහාරූපසිද්ධි, සංස්. කලුකොඳයාවේ සිරි පඤ්ඤාසේඛර හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, ප්‍රථම මුද්‍රණය, 1964. අවසාන ගාථා.

9. Encyclopedia Of Buddhism, vo.iii, p. 460

10. ආනන්ද'රඤ්ඤ රතනාදි මහා යතින්ද නිච්චප්පබුද්ධ පදුමප්පිය සෙවිතඞ්ඝී බුද්ධප්පියෙන ඝන බුද්ධ ගුණප්පියෙන ථෙරා'ලිනා රචිත පජ්ජමධුං පිබන්තු, පජ්ජමධු, 103 ගාථාව

11. පජ්ජමධු, 103 ගාථා සත්තය

12. Encyclopedia Of Buddhism, vo.iii, p. 460

13. මලලසේකර, ගුණපාල, ලංකා පාලි සාහිත්‍ය, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, නො. 217, ඔල්කට් මාවත, කොළඹ 11, ප්‍රථම සිංහල මුද්‍රණය, 1965, 165 පිටුව.

14. දක්ඛිණාරාමපතිනො පිටකත්තයධාරිනො බුද්ධප්පියව්හථෙරස්ස යො සිස්සානන්තිමො යති, තෙන සිද්ධත්ථනාමෙන ධීමතා සුවිවුත්තිතා ථෙරෙන ලිඛිතො එසො විචිත්තො සාරසඞ්ගහො, සාරසඞ්ග්‍රහ, සංස්. මේධානන්ද හිමි, යටමලගල, විද්‍යාසාගර යන්ත්‍රාලය, 1898, අවසානය

15. ...සඞ්ඩි යකඛරානං රසසා න සනතී'ති අනුසාරෙන කොචිති සා 'ඝනපපසාදකචොළියබුද්ධපපියාචරියං දසෙසති., මොග්ගල්ලාන පඤ්චිකා, සංස්. රත්මලානේ ශ්‍රී ධර්මාරාම හිමි, ශ්‍රී ලංකා රාජකීය මුද්‍රණාලය, 1896,අවසානය

16. 'ඔපසිලෙසිකාධාරං විනා ආධාරන්තරෙ ගහිතෙ සති වචනන්තරං සුත්තන්තරං විනා බ්‍යවහිතනී වත්තා කාතුං නව පක්කාති සම්බන්ධා , කෙචීති බුද්ධප්පියාචරියාදයො දස්සෙති.' මොග්ගල්ලාන පඤ්චිකා, අවසානය

17. සිංහල සාහිත්‍ය වංශය, 158 පිට

18. මොග්ගල්ලාන පඤ්චිකා, අවසානය

19. මහාවංසො, සංස්. මංගල ඉලංගසිංහ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 675, පී. ද. එස්. කුලරත්න මාවත, කොළඹ 10, ප්‍රථම මුද්‍රණය, 2006, 34 පරි. 10 ගාථාව

20. Gandhavamsa, The Pali Text Society, London, 1886, pp. 60-70

21. මහා රූපසිද්ධි ටීකා.

22. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සාහිත්‍ය, රත්න පොත් ප්‍රකාශකයෝ, 513, කොළඹ 10, තෙවන මුද්‍රණය, 2005, 439 පිටුව

23. ''පණ්ඩු හු මණ්ඩලෙ යො හු වඤ්ඤො සාමන්තභූමිපො සච්චසන්ධො තයෙ දක්ඛො චොලගඞ්ගොති විස්සුතො. ගුණාකාරොපෙළුම්පල්ලි ඉති විඤ්ඤූහි දස්සිතො ලංකාදීපම්හි සකලෙ දමිළාතලසමාකුලෙ ආගතා පාතුමත්තානං භූයො සාසනවුද්ධියා තම්බපණ්ණිද්ධජා ථෙරා සදා සද්ධම්මගොචරා ආගමං අනුරක්ඛත්තා තස්මිං වාසමකප්පයුං'' උපාසක ජනාලංකාර, සංස්. ධීරාලංකාර හිමි, රජ්ජම පියරතන හිමි, මාතර ගුණරතන හිමි, කඹුරුපිටියේ, විද්‍යාර්ථ ප්‍රකාශ මුද්‍රණාලය, 1926, අවසාන ගාථා.



24. 'සිස්සො දීපඞ්කරාමෙසා දමිළවසුමතිදීපලද්ධපකාසො', මහාරූපසිද්ධි, අවසාන ගාථා.

25. පජ්ජමධු, 103 ගාථා සන්නය. යස්ස ආචරියො ආසි සබ්බසත්‍රවිසාරදො අරඤ්ඤයතානන්ද මහාථෙරො

26. යො'කා සිහළභාසාය සීහළං සද්දලක්ඛණං යො ච සමන්තකූටස්ස වණ්ණනං වණ්ණයී සුභං තෙන වෙදෙහ ථෙරෙන කතායං රසවාහිනී, රසවාහිනී, සංස්. කැලිගම විජිතනන්ද හිමි, දාපනේ ශ්‍රී සුමන ප්‍රජා සංවර්ධන පදනම, සීදේවි ඔප්සෙට් ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිකේෂන්, කොළඹ පාර, කටුවාවල, බොරලැස්ගමුව, ප්‍රථම මුද්‍රණාලය, 2004.

27. අභිධර්මමූල ටීකා හෙවත් පරමත්ථප්පකාසිනී.

28. පාලි සාහිත්‍ය ඉතිහාසය, පිටුව 250

29. ආනන්දරඤ්ඤරතනාදී මහා යතින්ද නිච්චප්පබුද්ධ පදුමප්පිය සෙවිතඞ්ඝී, පජ්ජමධු, 103

30. යස්ස ආචරියො ආසි සබ්බසත්‍ථවිසාරදො අරඤ්ඤයතනානන්ද මහාථෙරො මහාගණා, සාරසමුච්චය.

31. Epigraphia Zeylanica, vol iv, Oxford University press, 1943, p .71

32. හිත්වා සහසා සබ්බෙ විහාරෙච තහිං තහිං යථො ජොභාරිනො යක්ඛා ලංකායං සාරමග්ගහුං තෙ චොළා රාජ රට්ඨං තං පුලත්ථිපුර තිට්ඨිකා රක්ඛපාසාණ කණ්ටම්හ ඨානාවධිමහුඤ්ජිසුං - මහාවංසො, 21, 22 ගාථා

33. ''සිරිසඟබෝ විජයබාහු රජ පා වහන්සේ තුමා සිය වික්මෙන් දෙමළ බලත් මුළු ලක්දිව අඳුරු දුරලා මුළු ලක්දිව් එක්සේසත් කළ රජ වළත්මිත්' - අමරවංස හිමි, කොත්මලේ, ලක්දිව සෙල්ලිපි, පනාකඩුව තඹ සන්නස, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ 11, ප්‍රථම මුද්‍රණය, 1969, 341 - 342 පිටු

34. පුරාවිද්‍යා සමීක්ෂණ වාර්තා, සෙනරත් පරනවිතාන, 1941, 31 පිට.

35. Hand Book Of Pali Literature, p. 106

36. Encyclopedia Of Buddhism, p. 460

37. "දක්ඛිණාරාමපතිනො පිටකත්තය ධාරිනො බුද්ධප්පිය මහාථෙරස්ස යො සිස්සානත්තිමො යති තෙන සුද්ධසී නාමෙන ධීමතා සුචවුත්තිනා ථෙරෙන ලිඛිතා එසො විචිතෙතා සාරසංගහො", සාරසඞගහ, අවසානය.

38. "රාමත්වය සමුබ්භූතො - තදායුජ්ඣපුරාගතො ජගතිපාලනාමෙන - විසසුතො හූ භුජත්තරො රණෙ වික්කමපමණ්ඩුං තං ඝාතාපෙත්වා මහාබ්බලො තතො චත්තාරි වස්සානි රජ්ජං කාරෙසි රොහණෙ" - මහාවංසො, පරි 54;13,14 ගාථා.

39. මහාවංසො, පරි 34. 78

40. Culavamso, The Pali Text Society, Oxford University Press, Chepter 34,1927, v. 78

41. පජ්ජමධු, සංස්. හක්මණ සිරි සංඝතිස්ස, පෙරවදන.

42. පාලි සාහිත්‍ය, 407 පිටුව.

43. 'පජ්ජමධුං පිබන්තු', පජ්ජමධුප 103 ගාථාව.

44. Hazra, Kanai Lal, Pali Language and Literature, vol.II, Frist Published in Indian, New Delhi, 1994, p. 727

45. ibid, p. 727

46. යත්‍රාසුමට්ඨසතමංගල ලක්ඛණානි සාධෙතු තං පදයුගං ජයමංගලාය, පජ්ජමධු, 5 ගාථාව

47. ලොකුත්තරාය සිරියා'ධිගමාය සුට්ඨු රාජන්ති යස්ස දිගුණානි'ව පාතුභූතා චක්කාසනාභි සහ තෙමි සහස්සරානි ත්‍යඞ්ඝී දිසන්තු සකලිස්සරියං ජනස්ස, එම, 9 ගාථාව

48. එම, 55 ගාථාව

49. ලාවණ්ණ'මණ්ණව පවාල ලතාද්වයා'භං තං දෙහ දෙව තරු පල්ලව කන්තිමන්තං චත්තා'රවින්ද මකරන්ද පරාජිසොභං රත්තා'ධරද්වය 'මධො කුරුතං ජනා'ඝං, එම, 54 ගාථාව.

50. ත්වං වේරහංසි සම්බුජ්ඣි යථාව සම්මා සම්පණ්ණ විජ්ජා චරණො සුගතෝ'සි හොන්තු ලෝකං විදෝ පුරිසධම්මසාරථී'සි සත්ථා'සි බුජ්ඣි භගවා'සි තථෙ'ව ජන්තු, එම, 84 ගාථාව.



51. සච්චිත්ත භූ නිදහිතං ජනතාය තුය්හං කල්‍යාණ වණ්ණ රතනං නව ජාතිභින්නං දුක්ඛග්ගි ඝෝර ජලු'පද්දුත ජාති ගෙහෙ තස්සා සුඛං භවතු ජීවිතුමාපදාය, එම, 85 ගාථාව.

52. එම, 86 ගාථාව.

53. එම, 87 ගාථාව.

54. එම, 88 ගාථාව.

55. එම, 96 ගාථාව.

56. සම්බුද්ධ සේල වලයන්තර ජාතන'චභා'නොතත්තතෝ තිපථගා යති සාගරට්ඨා ධම්මා'පගා සුති වසෙ'තරිතෙ පුණන්ති සම්භාර සසස'මිහ වත්තතු පචයන්ති, එම, 98 ගාථාව.

57. එම, 100 ගාථාව.

58. එම, 101 ගාථාව.

59. එම, 102 ගාථාව.

11 NOV 2017
පුස්තකාලය